# ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2026

## අයදුම්කරුවන් සඳහා උපදෙස්

01. සම්පූර්ණ කරන ලද අයදුම් පත රු.500.00 ක ආපසු නොගෙවන මුදලක් අයදුම්පතේ සදහන් කාර්යාලයක් වෙත ගෙවා ලබාගත් කුවිතාන්සිය සමග එම කාර්යාලයට භාරදිය හැකිය.

02 .අයදුම්පත් බහාලන කවරයේ ඉහල වම් කෙළවරේ "ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත් කරුවන් ලියාපදිංචි කිරීම 2026 " ලෙස සඳහන් කළ යුතුය.

03. අයදුම්පත් සම්පූර්ණ කිරීමට පෙර උපදෙස් හොඳින් කියවා තේරුම්ගෙන අයදුම්පත් සම්පූර්ණ කල යුතු අතර අඩුපාඩු සහිත අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත සමග ඉල්ලා ඇති පහත සඳහන් තොරතුරු ඇමුණුමක් මගින් ඉදිරිපත් කල යුතුය. (www.gampaha.dist.gov.lk වෙබ් අඩවියේ ඇති සම්පූර්ණ කරන ලද ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත සම්පූර්ණ කිරීම සුදුසු වේ)

i. ලියාපදිංචි සහතික වල ඡායා පිටපත් ( ව්‍යාපාර ලියාපදිංචි සහතිකය සහ CIDA ලියාපදිංචි සහතිකය/ අනුමත සමිති සඳහා සමිතියක් ලෙස ලියාපදිංචි සහතිකය)
ii. මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක්.
iii. 2025 වර්ෂයේ කොන්ත්‍රාත් ලියාපදිංචිය ලබාගෙන ඇත්නම් එහි අංකය සඳහන් කල යුතුය.

04. ලියාපදිංචි වීම සඳහා අනුමත සමිති වලට සහ CIDA ලියාපදිංචිය සහිත කොන්ත්‍රාත්කරුවන්ට අයදුම් කළ හැකිය.

ලියාපදිංචිය සඳහා අනුමත සමිති පහත සඳහන් වේ,

i. සමෘද්ධි ප්‍රජා මූල සංවිධාන / සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන
ii. විවිධ සේවා සමූපාකාර සමිති
iii. සමූපාකාර කම්කරු සමිති (කම්කරු සේවා සඳහා පමණක්)
iv. ග්‍රාම සංවර්ධන සමිති
v. පාසල් සංවර්ධන සමිති (බල සීමා ප්‍රදේශයට අදාළව පාසල් පරිශ්‍රයන්හි ක්‍රියාත්මක)
vi. ලියාපදිංචි ගොවි සංවිධාන
vii. ප්‍රජා සංවර්ධන සමිති ( පළාත් පාලන ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතුවලට දායක වන්නා වූ පළාත් පාලන කොමසාරිස්වරුන් යටතේ ලියාපදිංචි සමිති)
viii. ගැමි දිරිය මහජන සමාගම්
ix. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය යටතේ ලියාපදිංචි කරන ලද සහාධිපත්‍ය කළමනාකරණ සංස්ථා
x. විහාරස්ථ කාර්ය සාධන සමිති ( ස්වකීය විහාරස්ථ හා දහම් පාසල් පරිශ්‍රයන්හි ක්‍රියාත්මක)
xi. විහාරස්ථ දායක සභා (ස්වකීය විහාරස්ථ හා දහම් පාසල් පරිශ්‍රයන්හි ක්‍රියාත්මක)
xii. සමාජ සේවා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලයේ ලියාපදිංචි ග්‍රාමීය වැඩිහිටි කමිටු / සමිති
xiii. ප්‍රාදේශීය ලේකම්වරයාට සෑහීමකට පත් විය හැකි එකී ප්‍රාදේශීය ලේකම් යටතේ ලියාපදිංචි වී ඇති සමිති සහ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් හඳුනාගන්නා ප්‍රජා සංවිධාන

05. සෑම අයදුම්කරුවෙකුම ගම්පහ දිස්ත්‍රික්කයේ පදිංචි අයෙකු විය යුතු අතර මෙම ලියාපදිංචිය 2026 වර්ෂයේ ගම්පහ දිස්ත්‍රික්කයට අදාල සංවර්ධන ව්‍යාපෘති ඉටුකිරීම සඳහා වේ.

06. කිසියම් අනුමත සමිතියක් / කොන්ත්‍රාත්කරුවෙක් / ආයතනයක් නමින් වෙනත් පුද්ගලයින් අයදුම්පත් ඉදිරිපත් නොකල යුතු අතර, එවැනි අයදුම්පත් පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. අයදුම්පත පැහැදිලි තොරතුරු ඇතුළත් කර නිවැරදිව සම්පූර්ණ කර තිබිය යුතු අතර අසම්පූර්ණ හා අපැහැදිලි අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. අනුමත සමිතියක් අයදුම් කරන්නේ නම් සභාපති හෝ ලේකම් විසින් අයදුම්පත සහතික කර තිබිය යුතුය.

09. අයදුම් කරනු ලබන අනුමත සමිති 2026 වර්ෂය සඳහා ප්‍රතිසංවිධානය කර යාවත්කාලීන කර තිබිය යුතු අතර, CIDA ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් අයදුම් කරන අවස්ථාව වන විට ලියාපදිංචිය යාවත්කාලීන කර තිබිය යුතුය.

10. **ලියාපදිංචි කර ගැනීමෙන් පසු අදාල කොන්ත්‍රාත්කරුවන්ගේ හා අනුමත සමිති වල නාම ලේඛනය සෑම මාසයකම 15 වන දින හා 30 වන දින ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ www.gampaha.dist.gov.lk දරණ වෙබ් අඩවියේ පල කරනු ලබන බැවින් ඔබගේ ලියාපදිංචිය සනාථ කර ගැනීමට හෝ බාගත කර ගැනීමට හැකි වන අතර මේ සම්බන්ධ වැඩිදුර තොරතුරු 0332222453 අමතා ලබා ගත හැකිය.**